සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No } DDD/HO/14/1

ඔබේ අංකය / உமது இல / Your No } ........................

දිනය / திகதி / Date } 2017.01.24

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

## <u>දිවිනැගුම සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ අංක DDD/HO/14/1 හා 2016.09.26.දිනැති 2016/5 චක්‍රලේඛයේ අංක 06 හි i හා iv ට අදාල පහත සදහන් සංශෝධන සිදුකෙරේ.

02.නිවුන් දරු උපත් සඳහා ගෙවීම් කිරීමේදි උපත් සඳහා ගෙවන රු 7,500/ දීමනාව ප්‍රතිලාභී නොවන ඉල්ලීම් සඳහා අදාල නොවේ.ප්‍රතිලාභීන් නොවන ඉල්ලීම් සඳහා අදාල වනුයේ දරුවා පෝෂණය කිරීම සඳහා ගෙවන මසකට රු.5,000/ හා රු10,000/ මාසික දීමනාව පමණි.

03. එම චක්‍රලේඛයේ අංක 06 හි i යටතේ දරු උපත් සඳහා අවශ්‍ය ලියකියවිලි වශයෙන් ගර්භනි සටහන්පත /රෝහල මගින් නිකුත් කරන උපත් විස්තර පත්‍රිකාව හෝ සෞඛ්‍ය වර්ධන සටහන යනාදි ලේඛණ වලින් එකක් ගෙවීම් බලධාරියාට ඉදිරිපත් කර ඔහු හෝ ඇය එකී ලේඛණ වලින් සෑහීමට පත් වන්නේ නම් අදාල ගෙවීම් සිදුකල යුතුය. එමෙන්ම අජීවි දරු උපතට මාස 07 ඉක්මවූ බවට රෝහල් වෛද්‍යවරයාගේ වාර්තාව /පවුල් සෞඛ්‍ය සේවිකාවගේ ලිඛිත තහවුරු කිරීමෙන් අනතුරුව අදාල ගෙවීම් සිදු කල හැකිවේ.

04 එම චක්‍රලේඛයේ අංක 06 හි iv යටතේ මරණ සඳහා ප්‍රතිලාභ ගෙවිමේදි අදාල පෝරමය පුරවා ග්‍රාම නිලධාරිගේ වාර්ථාව හා දිවිනැගුම සංවර්ධන නිලධාරිගේ වාර්තාව ,කලාප හා මුලස්ථාන කළමනාකරුගේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී අදාල ගෙවීම් සිදුකල හැක. මසක් ඇතුලත දිවිනැගුම සංවර්ධන නිලධාරි විසින් මරණ සහතිකය මූලස්ථාන කලමනාකරුවෙත ඉදිරිපත් කළ යුතුය.

05 දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදලේ සාමාජිකත්වය හිමිවන්නේ සහනාධාර ලැබ් මාස 03 ඉක්මවූ පසුවය. සහනාධාර ලබාදුන් වහාම එම ප්‍රතිලාභියාගේ සාමාජික අයදුම් පත පුරවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා කලාප කාර්යාලයේ අදාල ගොනුවට පිටපතක් ඇමුණිය යුතුය

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
**011- 2887722**(Hotline)

06 වැඩිහිටි නිවාස හා ළමා නිවාස වල ජීවත් වන පුද්ගලයින් දැනට දිවිනැගුම සහනාධාර ලබා ගන්නේනම් ඔවුන් සදහා මරණ හා රෝහල් ගතවීමේ ප්‍රතිලාභද ලබාදිය හැක. බෞද්ධ භික්ෂූන් වහන්සේලා දැනට දිවිනැගුම සහනාධාර ලබා ගන්නේනම් ඔවුන් සදහාද එම රෝහල් ගතවීම් හා මරණ, ප්‍රතිලාභ ගෙවීම් කල හැකිය.තවද අන්‍ය ආගමික පූජක තුමන්ලාට මරණ ප්‍රතිලාභ ගෙවීම් කළ හැකිය.

07. ප්‍රතිලාභියා හෝ පවුලේ සාමාජිකයෙකු රෝහල් ගත වී සිටියදී ඔහුගේ හෝ ඇයගේ මරණය සිදුවුවහොත් එම ප්‍රතිලාභියාගේ මරණයට පමණක් ප්‍රතිලාභ ගෙවනු ලැබේ. උපතක් සදහා ප්‍රතිලාභියෙකු රෝහල් ගත වූ විට උපත සදහා පමණක් ප්‍රතිලාභ ගෙවනු ලැබේ .

08.තවද ළමා නිවාස වල ජීවත්වන දැනට සහනාධාර ලබන ප්‍රතිලාභින් සදහා විවාහ,රෝහල් ගත වීම්, මරණහා සිප්දොර ශිෂ්‍යත්ව සදහා ප්‍රතිලාභ ගෙවිය හැකිය.

09 . 2016/5 චක්‍රලේඛණයේ රෝහල් ගතවීම ප්‍රතිලාභ ගෙවීම් යටතේ දිනකට රු.250 බැගින් වර්ෂයකට උපරිමය දින 60 ක් සදහා යන්න තාවකාලිකව අත්හිටුවීමට සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩදුර අධ්‍යනයෙන් පසුව තීරණය ගන්නා බවත් එම තීරණය පසුව දැනුම් දෙනතුරු රෝහල් ගතවීම් ප්‍රතිලාභ ගෙවීම් දිනකට රු.250 බැගින් වර්ෂයකට උපරිමය දින 30 ක් ලෙස වියයුතු බව දැනුම් දෙමි.

2016/5 චක්‍රලේඛයේ සෙසු වගන්ති තවදුරටත් එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙහි සදහන් සංශෝධන උපදෙස් 2017 පෙබරවාරි 01 දින සිට වලංගු වනු ඇත .

නීල් බණ්ඩාර හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.පි.

02. දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරුන් වෙත - කරු දැ.ගැ.පි. හා අ.ක.ස.

03. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු දැ.ගැ.පි. හා අ.ක.ස.

04. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සියළුම ආංශික අධ්‍යක්ෂ වරුන් - කරු දැ.ගැ.පි. හා අ.ක.ස.

05. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රධාන ගණකාධිකාරීවරුන් - කරු. දැ.ගැ.පි. හා අවශ්‍ය උපදෙස් ලබාදීම පිණිස.

06. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කරු. දැ.ගැ.පි. හා අ.ක.ස.

07. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ - කරු. දැ.ගැ.පි. හා අ.ක.ස.

08. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - කරු දැ.ගැ.පි. හා අ.ක.ස.